Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 17 වන සතිය

විෂයය:-සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය

Prepared by – කලාප අධ්‍යාපන කාර්යාලය කෑගල්ල

ශ්‍රේණිය :- 11

**ක්‍රීඩා නීති රීති හා ආචාරධර්ම වලට අනුගත වෙමින් සමාජානුයෝගීව කටයුතු කරයි.**

තරගාවලියක තරග සටහන සැකසීම සඳහා සාකල්‍ය ක්‍රමය ද යොදා ගත හැක.
සාකල්‍ය ක්‍රමයේදී පරාජිත කණ්ඩායම තරගාවලියෙන් ඉවත් කිරීමක් සිදු නොවේ.සෑම කණ්ඩායමකටම එකිනෙකා අතර තරග කිරීමට අවස්ථාව ලැබේ.
මෙහිදී කණ්ඩායම් යුගල කිරීමට චක්‍රීය ක්‍රමය භාවිතා කළ යුතු වේ.සාකල්‍ය ක්‍රමය කොටස් දෙකකට වෙන් කර ඇත.
1 කණ්ඩායම් සංඛ්‍යාව ඉරට්ටේ වූ විට
2 කණ්ඩායම් සංඛ්‍යාව ඔත්තේ වූ විට

කණ්ඩායම් ගණන ඉරට්ටේ වූ විට:-

උදා- කණ්ඩායම් ගණන 8ක් වූ විට
කණ්ඩායම් චක්‍රියව කරකැවීම

| | 1 වටය. | 2 වටය |
|---|---|---|
| 1-2 | 1-2 | 1-8 |
| 8-3 | 8-3 | 7-2 |
| 7-4 | 7-4 | 6-3 |
| 6-5 | 6-5 | 5-4 |

1 කණ්ඩායම ස්ථාවරව තබා අනෙක් කණ්ඩායම් වාමාවර්ථව හෝ දක්ෂිණාවර්තව කැරකවිය හැකිය.

1)කණ්ඩායම් ගණන **8ක්** වූ තරගාවලියක සාකල්‍ය ක්‍රමයේ තරග සටහන සම්පූර්ණ කරන්න.

තරග සංඛ්‍යාව සෙවීමට $n(n-1)/2$ සූත්‍රය යොදා ගත හැකිය.n යනු කණ්ඩායම් ගණනයි.
n-8 වන විට
$8(8-1)/2=8(7)/2=28$ තරග ගණන 28 කි.

2) කණ්ඩායම් ගණන 10ක් හා 14 ක් වන සාකල්‍ය ක්‍රමයේ තරග සටහන් ඇඳ පැවැත්විය යුතු තරග ගණන සොයන්න.